# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/47 - 2014 මැයි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2014.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කැස්බෑව නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම

බස්නාහිර පළාතේ පළාත් සභාවට තේරීපත්වීම හේතුකොට ගෙන කැස්බෑව නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පහල වත්තගේ දොන් ලෝෂන් ලෙනාඩ් කරුණාරත්න නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කැස්බෑව නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන පතිරගේ දොන් මහේන්ද්‍ර මොහාන්ලාල් නානායක්කාර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කැස්බෑව නගර සභාවේ තේරීම්භාර නිලධාරී රාජපක්ෂගේ වජිර නිශාන්ත ගුණවර්ධන වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, පතිරගේ දොන් මහේන්ද්‍ර මොහාන්ලාල් නානායක්කාර මහතා කැස්බෑව නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරාපත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

වජිර ගුණවර්ධන,
තේරීම්භාර නිලධාරී,
කැස්බෑව නගර සභාව.

2014 මැයි මස 28 වන දින,
කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රාජගිරිය.

06 - 331


1A - G 019630 — 75 (2014/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*